| | | |
|---|---|---|
| **I.** | තනතුරු | :- **1. අධ්‍යක්ෂ (ඉංග්‍රීසි භාෂා)** |
| **II.** | සේවා ගණය | :- ජ්‍යෝෂ්ඨ කළමනාකරණ (HM 1-1) |
| **III.** | වැටුප් ක්‍රමය | :- රු. 80,295 – 15 x 2270 – 114,345/= මාසික |
| **IV.** | වයස් සීමාව | :- අවුරුදු 35 ට නො අඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. |

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ ඉංග්‍රීසි භාෂා ක්ෂේත්‍රය ඇතුළත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අධ්‍යයන හා පර්යේෂණ ක්ෂේත්‍රයේ/ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම. (අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ තනතුරු කළමනාකරණ මට්ටම සේ සැලකේ.)

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ ඉංග්‍රීසි භාෂා ක්ෂේත්‍රය ඇතුළත් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක ජ්‍යෝෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ තනතුරක/ දීපව්‍යාප්ත සේවයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. "ජ්‍යෝෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ" (AR 2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| **I.** | තනතුරු | :- **2. අධ්‍යක්ෂ (මුද්‍රණ හා ප්‍රකාශන)** |
| **II.** | සේවා ගණය | :- ජ්‍යෝෂ්ඨ කළමනාකරණ (HM 1-1) |
| **III.** | වැටුප් ක්‍රමය | :- රු. 80,295 – 15 x 2270 – 114,345/= මාසික |
| **IV.** | වයස් සීමාව | :- අවුරුදු 35 ට නො අඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. |

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිපාලන/ කළමනාකරණ/ වාණිජ/ තාක්ෂණවේදය/ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සමඟ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක මුද්‍රණ හා ප්‍රකාශන විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. මුද්‍රණ හා ප්‍රකාශන ක්ෂේත්‍රය පිළිබඳ මධ්‍යම කළමනාකරණ මට්ටමේ (MM) සේවා ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**